# ඇබෑර්තු

## ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI)

### තාක්ෂණ අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ**

**ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු - ජ්‍යෙෂ්ඨ කළමනාකාර ශ්‍රේණිය (HM 1-1)**

## ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) තනතුර

**සුදුසුකම් :**

**බාහිර :**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් ගිණුම්කරණය / වාණිජ්‍යය / මූල්‍ය කළමනාකරණය / ව්‍යාපාර කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය පිළිබඳ (වසර හතරක) විශේෂ උපාධිය හෝ පංති සාමාර්ථයක් සහිතව (වසර තුනක) සාමාන්‍ය උපාධිය

සමග

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල කොමිෂන් සභාව පිළිගත් ගිණුම්කරණය / මූල්‍ය කළමනාකරණය / ව්‍යාපාර කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාද් උපාධියක් (මාස්ටර්ස්) හෝ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක තනතුරෙහි විෂය පථයට අදාළ වරලත් සාමාජිකත්වය.

**ඉහත තනතුර සඳහා පළපුරුද්ද :**

ප්‍රථම උපාධිය ලැබීමෙන් පසු සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ වසර 13 ක අවම අදාළ පළපුරුද්ද.

**අභ්‍යන්තර (පහත 01 හෝ 02)**

01. ඉහත බාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.
02. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් ගිණුම්කරණය / මූල්‍ය කළමනාකරණය / ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාද් උපාධි සුදුසුකම් (මාස්ටර්ස්) හෝ වෘත්තීය වරලත් ආයතනයක තනතුරෙහි විෂය පථයට අදාළ වරලත් සාමාජිකත්වය සමග තනතුරට අදාළ ක්ෂේත්‍රයක කළමනාකාර ශ්‍රේණියේ වසර 13 ක පළපුරුද්ද.

අංශයේ අධීක්ෂණ භූමිකාව තෝරාගනු ලබන අයදුම්කරු මත රඳා පවතිනු ඇත. ඔහු / ඇය සෑම මට්ටමකම කාර්ය මණ්ඩලය සමග පහසුකම් සැලසීමේ විශිෂ්ඨ නායකත්ව හා සන්නිවේදන නිපුණතා සහිත අයකු විය යුතුය.

**වැටුප් පරිමාණය :**

ශ්‍රීලං.රු. 80,295.00 - 15 x 2,270 - ශ්‍රීලං.රු. 114,345.00

**වයස :**

අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට ඉහළ වයස් සීමාව අදාළ නොවේ)

**වෙනත් වරප්‍රසාද**

01. රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED 1/2015 හා PED 1 (2015) (i) පරිදි වෙන්කළ වාහනයක් හෝ ප්‍රවාහන දීමනාව
02. ප්‍රයෝජනයට නොගත් වෛද්‍ය නිවාඩු සඳහා ආපසු මුදල් ගෙවීම – කැබිනට් මණ්ඩලය මගින් අනුමත කළ පරිදි
03. ජීවිතාරක්ෂණ ආවරණය හා වෛද්‍ය රක්ෂණාවරණය
04. සීමාවකට යටත්ව වෛද්‍ය වියදම් ආපසු ගෙවීම
05. මහා භාණ්ඩාගාරය මගින් අනුමත කළ පරිදි වාර්ෂික දිරි දීමනාව
06. වෘත්තීමය පරිසරයක වැඩ කිරීමේ අවස්ථාව
07. වෘත්තීය දීමනාව
08. සන්නිවේදන දීමනාව

සම්පූර්ණ නම, වයස, අධ්‍යාපන සුදුසුකම් සහ වෙනත් ඕනෑම විස්තර ඇතුළත් අයදුම්පත්, සහතිකවල පිටපත් හා ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් ලිපිනයන් සහ දුරකථන අංකයන් සමග කොළඹ 08, ඇල්විටිගල මාවත, වික්ටෝරියා පෙදෙස, නො. 17, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත 2022.12.20 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. රාජ්‍ය අංශයේ ආයතනයන්හි සේවයේ නියුක්ත අය තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. අයදුම් කරන තනතුර ලිපි කවරයේ වම් ඉහළ කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**

**ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය.**